31/08/2011 - දිනමිණ

**කොළඹ මහනගර සභාව දේශපාලන පාපන්දුවක් නොවේ**
**ජනතාවට උපරිම සේවාවක් ලබා දීමට කැපවෙනවා - මිලින්ද මොරගොඩ**

කොළඹ මහනගර සභාව දේශපාලන පාපන්දුවක් නොවන බැවින් මහනගර සභාවෙන් සේවය ලබන ජනතාවට උපරිම සේවය ලබාදීම සහ ඔවුන් සුරක්ෂිත කිරීම සිය අපේක්ෂාව බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මිලින්ද මොරගොඩ මහතා පවසයි.

කොළඹ මහනගර සභාව දේශපාලන පාපන්දුවක් බවට පත්කර ගැනීමට ඇතැම් පිරිස් උත්සාහ දරන බවත් ප්‍රතිරූප දේශපාලනය වෙනුවට ප්‍රතිපත්තිමය දේශපාලනයක නිරතවීම මගින් කොළඹ නගර වැසියන්ට සේවය කළ හැකි බවත් මොරගොඩ මහතා සඳහන් කළේය.

කොළඹ මහනගර සභාව හා නාගරික බල ප්‍රදේශය තුළ විවිධ ජනවර්ගවලට අයත් ජන කොටස් ජීවත්වන අතර ඔවුන්ගේ ගැටලුවලට පිළිතුරු ලබාදිය හැක්කේ පැලැස්තර විසඳුම් මගින් නොව ස්ථිරසාර වැඩපිළිවෙළක් අනුගමනය කිරීමෙන් බවත් හෙතෙම කීය.

කොළඹ නගර වැසියන්ගේ සහ කොළඹ නගරයට පැමිණෙන ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා රජය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇති බවද මොරගොඩ මහතා පැවසීය. කොළඹ නගර සංවර්ධනය හා නගර අලංකරණය වෙනුවෙන්ද බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර අප සෑම මොහොතකම කටයුතු කළයුත්තේ සේවය ලබන මහජනයාගේ අවශ්‍යතා ඉලක්ක කරගනිමින් බවද හෙතෙම කීය.

කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා මේ බව සඳහන් කළේ කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී ඊයේ (30) පැවති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගි වෙමිනි.

පුරපති අපේක්ෂකයා ලෙස තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ලබන සතියේදී එළිදක්වන බවද මොරගොඩ මහතා වැඩි දුරටත් පැවසීය.